# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2403/63 – 2024 සැප්තැම්බර් මස 28 වැනි සෙනසුරාදා – 2024.09.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/236.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.10.29 දිනැති හා අංක 2303/55 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඇතුල් කෝට්ටේ, ජයවීර මාවත, අංක 26/B හි පදිංචි එම්. එන්. ඒ. විජේසේකර මිය සහ කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/66/2022 හා 2024.08.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

IR/COM/04/2019/236
A /66/2022

එම්. එන්. ඒ. විජේසේකර මිය,
26/B, ජයවීර මාවත,
ඇතුල්කෝට්ටේ.

*සහ*

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය ගරු මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා සමාංක 2022.10.20 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත්කර, මා වෙත යොමු කොට ඇත.

***මෙම ආරාවුලට හේතු වී ඇති කරුණු වනුයේ :***

''සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ A VII ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරට තෝරා ගැනීම සඳහා 2018 ජූලි මස පැවති සම්මුඛ පරීක්ෂණයේ දී B1 ශ්‍රේණියේ ගිණුම් ලිපිකාරිනියක ලෙස සේවය කරන එම්. එන්. ඒ. විජේසේකර මිය හට යම් අසාධාරණයක් සිදුවී ඇත් ද? යන්න හා එසේ සිදුවී ඇත්නම් ලැබිය යුතු සහනය කවරේ ද යන්න පිළිබඳව වේ.''

එය කම්කරු කොමසාරිස් ජනරාල්ගේ සමාංක IR/COM/04/2019/236 හා 2022.10.13 වැනි දිනැති නියෝගය පරිදි වේ. පහත දිනවල දී සරත් චන්ද්‍රසිරි විතාන මහතා විසින් නඩු වාර 09ක් පවත්වා ඇත.

*දිනය*

2022.11.17
2022.12.01
2022.12.09
2023.01.12
2023.02.09
2023.03.23
2023.03.24
2023.07.13
2023.07.31

මෙම ඉල්ලුම්කාරිය වන එම්. එන්. ඒ. විජේසේකර මිය පළමු පාර්ශ්වය ලෙසත් දෙවන පාර්ශ්වය ලෙස මෙකී ඉල්ලුම්කාරියගේ සේවා ආයතනය වන සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනය පාර්ශ්වකරුවන් වී ඇති අතර පළමු පාර්ශ්වය වෙනුවෙන් බලයලත් නියෝජිත G. W. ග්‍රේෂන් සිල්වා මහතාත් දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ සුජීවා කුමාරි මහත්මියත් පෙනී සිටී.

මෙම ඉල්ලුම්කාරිය ඉල්ලා සිටිනු ලබන්නේ සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ B1 ශ්‍රේණියේ ගිණුම් ලිපිකාරිණියක ලෙස සේවය කරමින් සිට A VII ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරට තෝරාගැනීම සඳහා 2018 ජූලි මස පැවති සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වී සිටිය ද එම සම්මුඛ පරීක්ෂණයේ දී A VII ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරට තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බවය. එසේම එම තෝරා නොගැනීමේ හේතුවෙන් ඇයට සිදුවී ඇති අසාධාරණය විසඳා සහනයක් ලෙස,

- 2019 මාර්තු මාසයේ සිට A 7 ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරේ පිහිටුවන ලෙසට ප්‍රදානයක් ද,
- 2019 මාර්තු මාසයේ සිට A 7 ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරට හිමි වැටුප් තලයේ පිහිටුවා එකී වැටුප් තලය මත මේ දක්වා හිඟ වැටුප් ගෙවන ලෙසට ප්‍රදානයක් ද,
- 2020 මාර්තු මාසයේ සිට A 7 ශ්‍රේණියට හිමි වාර්ෂික වැටුප් වර්ධක හා එකී වැටුප් වර්ධකවල හිඟ වැටුප් ගෙවන ලෙසට ප්‍රදානයක් ද,
- මෙකී සියලු ගෙවීම්වලට අදාළ වන ව්‍යවස්ථාපිත ගෙවීම් කරන ලෙසට ප්‍රදානයක් ද,
- ගරු බේරුම්කරණ අධිකරණයට මැනවැයි හැඟෙන වෙනත් සහනයන් ද බේරුම්කරණ අධිකරණයෙන් ලබාදෙන ලෙස ඇයද සිටී.

එම සම්මුඛ පරීක්ෂණයේ දී තෝරා ගැනීමේ ක්‍රමවේදයට අදාළවන විස්තර වාර්තා හා ලේඛන ඉදිරිපත් කරමින් අපේක්ෂිත සහනයක් ලබා දී තමාට සිදු වී ඇති අසාධාරණය බේරුම්කර දෙන ලෙස වැඩි දුරටත් ඉල්ලීම් කර ඇත.

මෙම සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන නිර්නායකයන් මත ලකුණු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| 01. මූලික අධ්‍යාපන සුදුසුකම් | - | 25 |
| 02. වාර්ෂික ඇගයීම් | - | 20 |
| 03. ජ්‍යෙෂ්ඨත්වය | - | 25 |
| 04. අමතර සුදුසුකම් | | |
| (i) කාර්ය සාධනය<br>(ii) සුදුසුකම්<br>(iii) අදාළ විෂය පළපුරුද්ද<br>(iv) අමතර සේවා පුහුණු<br>(v) ක්‍රීඩා | } | 10 |
| 05. සම්මුඛ පරීක්ෂණය | - | 20 |
| | | 100 |

*නිරීක්ෂණ*

මූලික අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම ද අදාළ සම්මුඛ පරීක්ෂණයෙන් ඉල්ලුම්කරුවන් වෙත නිවැරදි ලෙස ලබා දී ඇති බව නිරීක්ෂණය කරමි.

එම සම්මුඛ පරීක්ෂණයට ලකුණු දීමේ නිර්ණායකයන් අනුව සේවා කාලය සඳහා ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගෙන ලකුණු ලබා දී ඇති බව නිරීක්ෂණය කරමි.

මෙම ඉල්ලුම්කාරිය ගිණුම් හා මුදල් අංශයේ වසර 24ක අධික සේවා කාලයක් සපුරා ඇත. මෙම සම්මුඛ පරීක්ෂණයට ආසන්නතම වසර 3 ක වාර්ෂික ඇගයීම්වල තම කාර්යාංශයේ සෘජු විධායකයා ලබා දී ඇති ලකුණු හේතු නොදක්වා කාර්යාංශ ප්‍රධානියා අඩුකොට සංශෝධනය කර ඇත. එසේ වුවද මෙම නිර්නායකට අදාළ පූර්ණ ලකුණු ලබාගෙන ඇතත් මෙම කාර්යාංශ ප්‍රධානියා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් වී ඇති බව නිරීක්ෂණය කරමි.

මෙම ඉල්ලුම්කාරිය ගිණුම් හා මුදල් අංශයේ වසර 24කට අධික සේවා කාලයක් සපුරා ඇති බැවින් ජ්‍යෙෂ්ඨත්වයට හිමි ලකුණු ලබා ඇති බව නිරීක්ෂණය කරමි.

එසේ වුවද, ඇය වෙත අමතර සුදුසුකම් වෙනුවෙන් ලබා දී ඇති ලකුණු හා මැයට වඩා මෙම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ ඇතැම් අයට එම නිර්නායකය යටතේ ලබා දී ඇති අතර ලකුණු හා සැසඳීමේ දී අසාධාරණයක් සිදුව ඇති බව නිරීක්ෂණය කරමි.

මෙහි විෂයහාර ක්‍රියාකාරකම් හා අමතර සුදුසුකම් නිර්නායකට උපරිම ලකුණු 10ක් ලබා ගත හැකි අතර, මෙම ඉල්ලුම්කාරියට ලැබී ඇත්තේ ලකුණු 4.5ක අවම අගයකි.

එසේ වුවද උපරිම ලකුණු ලබාගත් අන් ඉල්ලුම්කරුවන්ගේ අමතර සුදුසුකම්වලට ලකුණු ලබාගෙන ඇති අවස්ථා අනුව කෙටිකාලීන සුදුසුකම් වෙනුවෙන් ඒ අයට ලබාදීමත් මැය ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයීය වසර 3ක කළමනාකරණ ඩිප්ලෝමාව අවසන් කර තිබීම පිළිබඳව සාධාරණ අගයක් ලබා දී නොමැත. එය මැයට සිදුවූ අගතියක් ලෙස නිරීක්ෂණය කරමි. තවද ඇය වාණිජ විෂයධාරා යටතේ වෘත්තියට අදාළ අධ්‍යාපනික සුදුසුකම් ලබා තිබීම සැලකිල්ලට නොගෙන සිටීම ද නිරීක්ෂණය වේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළ ලකුණු ලබා ගත් අන් ඉල්ලුම්කරුවන් ඍජුව කාර්යාංශ ප්‍රධානිට වගකියන අයවීමත් මුලින් සඳහන් කළ වාර්ෂික කාර්ය සාධන වාර්තා හේතු නොදක්වා සංශෝධනය කළ නිලධාරියා සම්මුඛ පරීක්ෂණයේ සාමාජිකයෙකු වීම ද ගැටලු සහගත බවට ඉල්ලුම්කාරියගේ ඉල්ලීම සැලකිල්ලට ගතයුතු චර්යාත්මක හේතුවක් බවට නිරීක්ෂණය කරමි. මෙහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය ලකුණු 20ක් වුව ද ඇය වෙත ලැබී ඇත්තේ ඉන් ලකුණු 10කි. මෙහිදී අන් සුදුසුකම් ලබා ඇති තෝරාගන්නා ලද සුදුසු ඉල්ලුම්කරුවන් ලබාගත් උපරිම ලකුණු ප්‍රමාණය 16කි.

*තීරණය*

මෙම දෙපාර්ශ්ව විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන හා දිවුරුම් පෙත්සම් ඇසුරින් මෙන්ම සාක්ෂි කැඳවීම හරස් ප්‍රශ්න හා පැහැදිලි කිරීම් ප්‍රකාශ ද සැලකිල්ලට ගෙන තීරණය කිරීම බේරුම්කරණයට සැලකිල්ලට ගත් සාධාරණ හේතු වේ.

මේ සඳහා දෙපාර්ශ්වයේ ම සිය අවස්ථාවන් උපරිම ලෙස විනිශ්චය සඳහා අවස්ථානුකූලව සහාය ලබාදීම හේතුව මත ඒකපාර්ශ්වීය පරීක්ෂණයක් පවත්වාලීමට සිදුනොවින. මෙම ආරාවුලට හේතු වී ඇති උසස් වීම ලබා නොදීම ඉදිරිපත් කර තිබූ සම්මුඛ පරීක්ෂණ වාර්තා ලකුණු ලබා දීමේ නිර්නායක හා අනෙකුත් සියලු ඉදිරිපත් කිරීම් අනුව විමර්ෂණයට භාජනය කළ බව සඳහන් කරමි.

මෙම සම්මුඛ පරීක්ෂණයේ වාර්ෂික කාර්යසාධන ඇගයීම්, අනෙකුත් සුදුසුකම් හා සම්මුඛ පරීක්ෂණය යන නිර්නායක අනුව මෙම ඉල්ලුම්කාරියට ලබා ගැනීමට හැකි උපරිම ලකුණු ප්‍රමාණය හිමි නොවීම මත ඇයට අසාධාරණයක් සිදුව ඇති බව ඔප්පු වී ඇති බවත්, එම ලකුණු ලබාදීම නිවැරදි නොවන බවත් විමසීමට සිදුවූ හේතුවක් බව සඳහන් කරමි. එසේ නිවැරදි උපරිම ලකුණු ඉල්ලුම්කාරිය වෙත හිමිවූයේ නම් ඇය උපරිම ලකුණු ලබාගත් ඉල්ලුම්කරුවන් අතරට එක්විය යුතු බව සඳහන් කරමි.

මේ අනුව, මැයට අගතියක් සිදුව ඇති බවත්, මේ සඳහා ඇයට සාධාරණ බේරුම්කරණ තීරණයක් ලබාදිය යුතු බවත් නිගමනය කරමින්,

- 2019 මාර්තු මාසයේ සිට A 7 ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරේ පිහිටුවන ලෙසටත්,
- 2019 මාර්තු මාසයේ සිට A 7 ශ්‍රේණියේ ගිණුම් විධායක තනතුරට හිමි වැටුප් තලයේ පිහිටුවා ඒ අනුව වාර්ෂික වැටුප් වර්ධක ලබා දී පහත ගණනය කර ඇත.

| කාල සීමාව | ගෙවා ඇති වැටුප | ශ්‍රේණිය අනුව ගෙවිය යුතු වැටුප | එක් මාසයක හිඟ වැටුප (රු.) | හිඟ වැටුප (රු.) |
|---|---|---|---|---|
| 2019 මාර්තු සිට 2020 පෙබරවාරි දක්වා | 83,300.00 | 105,145.00 | 21,845.00 | 262,140.00 |
| 2020 මාර්තු සිට 2021 පෙබරවාරි දක්වා | 84,315.00 | 106,505.00 | 22,190.00 | 266,280.00 |
| 2021 මාර්තු සිට 2022 පෙබරවාරි දක්වා | 106,675.00 | 134,835.00 | 28,160.00 | 337,920.00 |
| 2022 මාර්තු සිට 2023 පෙබරවාරි දක්වා | 107,945.00 | 136,535.00 | 28,590.00 | 343,080.00 |
| 2023 මාර්තු සිට 2024 පෙබරවාරි දක්වා | 109,215.00 | 138,235.00 | 29,020.00 | 348,240.00 |
| 2024 මාර්තු සිට 2024 ජූලි දක්වා | 110,485.00 | 139,935.00 | 29,450.00 | 147,250.00 |
| එකතුව | 601,935.00 | 761,190.00 | 159,255.00 | 1,704,910.00 |

ඒ අනුව ගෙවිය යුතු හිඟ මුදල වන රු. 1,704,910.00 (දාහත් ලක්ෂ හාරදහස් නවසිය දහය) මෙම ප්‍රදානය ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් මැද කොළඹ කාර්යාලය වෙත තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වයට නියම කරමි.

අනෙකුත් ව්‍යවස්ථාපිත ගණනයන් සිදුකර ඉදිරියට ගෙවීම් කරන ලෙසටත් ඒ සඳහා මෙය බාධාවක් නොවන බව සඳහන් කරන අතර මෙම තනතුරෙහි පිහිටුවීම මැයට පෞද්ගලික වන සේ ලබාදීමටත් නියම කරමි.

මෙම ප්‍රදානයන් ලබාදීම ඉදිරිපත් කරන ලද සියලු ලේඛන හා වාර්තා මෙන්ම සාක්ෂි අනුව සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

**සරත් චන්ද්‍රසිරි විතාන,**
බේරුම්කරු.

2024 අගෝස්තු මස 02 වැනි දින.

EOG 09 – 0202

---

මගේ අංකය: IR/COM/04/2018/204.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.01.14 දිනැති හා අංක 2314/89 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අංගොඩ, වල්පොල, සදහම් මාවත, අංක 113 හි පදිංචි ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා සහ බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, ''මග නැගුම මහමැඳුර'' හි පිහිටි මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/14/2023 හා 2024.08.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව - කොළඹ

ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මයා,
අංක 113,
සදහම් මාවත,
වල්පොල, අංගොඩ.

*ආරවුල් අංකය* : IR/COM/04/2018/204

*පැමිණිලිකරු*

*එදිරිව:*

*බේරුම්කරණ අංකය* : A/14/2023

මාර්ග සංවර්ධන අධිකාරිය
''මග නැගුම මහමැඳුර'',
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,,
කොස්වත්ත,
බත්තරමුල්ල.

*වගඋත්තරකරු*

2024 ජූලි මස 02 දින දී ය.

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :

''මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩ අධිකාරී ප්‍රවාහන ලෙස සේවය කළ ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට යාන්ත්‍රික ඉංජිනේරු තනතුර හිමි ද යන්න හා හිමිනම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට හිමි සහනයන් කවරේ ද යන්න පිළිබඳ වේ.''

**පසුබිම**

පළමු පාර්ශ්වය විසින් සිය මූලික සාක්ෂිය දිවුරුම් ප්‍රකාශ මගින් ලබා දුන් අතර ඒ අනුව පළමු පාර්ශ්වයේ සාක්ෂිකරු වූ ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතා A1 සිට A16 දක්වා ලේඛන ලකුණු කරමින් සාක්ෂි ලබා දී ඇත. පළමු පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ජී. ඩබ්. ග්‍රේෂන් ද සිල්වා මහතා පෙනී සිටින ලදී.

වගඋත්තරකාර පාර්ශ්වය වන මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් R1 සිට R17 දක්වා ද X1 සිට X3 දක්වා ද ලේඛන ලකුණු කරමින් මාර්ග සංවර්ධන අධිකාරියේ මානව සම්පත් පරිපාලක වරාපිටියහේවාගේ කාන්ති මිය සාක්ෂි ලබා දී ඇත. වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරී නීතිඥ පියුමාලි පෙරේරා මිය සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ හජාර් අසාර් මෙනවිය සහ ඔෂිනි සේනාධිපති මෙනවිය පෙනී සිටින ලදී. දෙපාර්ශ්වය විසින් ම ලිඛිත දේශන මගින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

**පළමු පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය**

පළමු පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශ මගින් සාක්ෂි ලබා දෙමින් සහ ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශ කොට ඇත.

1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරී පනත සහ 2009 අංක 37 දරන මාර්ග සංවර්ධන (සංශෝධිත) පනතේ ප්‍රතිපාදන අනුව මාර්ග සංවර්ධන අධිකාරියේ සියලුම පරිපාලන කටයුතු මෙහෙයවීම සහ ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ගැනීම සිදුකරනු ලබන්නේ සභාපති ඇතුළු අධ්‍යක්‍ෂක මණ්ඩලය බවත් එකී අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්‍ෂක ජනරාල්වරයා සහ සියළුම නිලධාරීන් බැඳී සිටින බව.

පළමු පාර්ශ්වය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සිදුකරනු ලැබූ HRC/7041/06 පැමිණිල්ලට අනුව A6 ලෙස ලකුණු කර ඇති මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්‍ෂණ නිලධාරී වාර්තාවේ සඳහන් ''අදාළ තනතුර ලබාදීමට සුදුසු යැයි නිගමනය කරමි'' ලෙස දක්වා ඇති නිර්දේශය ක්‍රියාත්මක කරන ලෙස දන්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය වෙත A7 ලෙස ලකුණු කර ඇති ලිපිය මගින් එකී තීරණය දැනුම් දී ඇතත් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් එකී නිර්දේශය ක්‍රියාත්මක කර නොමැති බව.

මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව පැමිණිලිකාර පළමු පාර්ශ්වය යාන්ත්‍රික ඉංජිනේරු තනතුර ලබාදීම නිර්දේශ කරමින් වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්‍ෂක මණ්ඩලය වෙත A8 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාව මගින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත් එකී අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනාව A9 ලෙස ලකුණු කර ඇති අධ්‍යක්‍ෂක මණ්ඩල තීරණය මගින් අනුමත කර ඇති බවත්, එසේ අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් අනුමත කර තිබියදී වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් එකී තීරණය ක්‍රියාත්මක කර නොමැති බවත් ගොනු කරන ලද A8 සහ A9 ලේඛන වගඋත්තරකාර පාර්ශ්වය විසින් අභියෝගයට ලක්කර නොමැති බව.

A1 සිට A16 දක්වා ලකුණු කරන ලද ලේඛන සමග දිවුරුම් ප්‍රකාශය මගින් ගොනු කරන ලද මූලික සාක්ෂියේ A6 සිට A15 දක්වා ලේඛනවල අන්තර්ගතය වගඋත්තරකාර පාර්ශ්වය විසින් හබකර නොමැති බව.

වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ සාක්ෂිකාරිය විසින් අසත්භාවයෙන් සහ ද්වේෂ සහගතව සාක්ෂි ලබා දී ඇති බව. එකී කරුණු සනාථ කිරීම සඳහා වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2023.11.08 දින ලබා දී ඇති සාක්ෂියෙන් කොටසක් පහත පරිදි උපුටා දක්වා ඇත.

> *''උසස් පෙළ සහතිකය ඉදිරිපත් කරපු බොරුවක්, ඕපන් යුනිවර්සිටි තාක්‍ෂණික සහතිකය බොරුවක්, ඉස්කෝලේ තර්ස්ටන් විද්‍යාලය සහ ඕපන් යුනිවර්සිටි යන දෙකේම තහවුරු කරලා එවලා තියෙනවා ඒ රිසාල්ට් බොරුවක් කියලා. ඒකට තමයි විධිමත් විනය පරීක්‍ෂණයක් කරලා සේවයෙන් පහකරලා තියෙන්නේ. ඒ සේවයෙන් පහකිරීමට අනුව LT ගිහිල්ලා. මම දන්නේ නැහැ. කොහොමද එම කරුණු ඔප්පු වී තියෙද්දී සේවයේ පිහිටුවන්න සමථ කොන්දේසියට එකග වුනේ කොහොමද කියලා. නමුත් කොහොමහරි සේවයේ පිහිටුවලා තියෙනවා.''*

වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ සේවා යෝජකයාගේ ක්‍රියාකලාපය සාධාරණ හා යුක්ති සහගත නොවන බව.

**වගඋත්තරකාර පාර්ශ්වයේ නෛතික ස්ථාවරත්වය**

වගඋත්තරකාර මාර්ග සංවර්ධන අධිකාරියේ මානව සම්පත් පරිපාලක සාක්ෂි ලබා දී ඇති අතර සිය ලිඛිත දේශන මගින් පහත ස්ථාවරයන් ප්‍රකාශයට පත් කර ඇත.

R15 ලෙස ලකුණු කර ඇති මාර්ග සංවර්ධන අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටියෙහි 13 වන පොදු කොන්දේසියට අනුකූලව එකී තනතුර සඳහා අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු අතර, එහි අවසන් ප්‍රතිඵල මත ඉහළ ලකුණු ලබා සමත්වන අයදුම්කරුවන් හට අදාළ පුරප්පාඩු අනුව පත්වීම් ලබාදීම සිදුකරන බව.

2005 වර්ෂයේ දී යාන්ත්‍රික ඉංජිනේරු තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 07 ක්වූ බවත්, ඉන් එක් තනතුරක් පමණක් පුරප්පාඩුව පැවති බවත්, එකී පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවූ බවත්, ඒ අනුව ඉල්ලුම්කරු ඇතුළු යාන්ත්‍රික අධිකාරීවරු දෙදෙනෙකුගෙන් අයදුම්පත් ලැබී තිබූ බවත්, මෙම ඉල්ලුම්කරු අයදුම්පත ඉදිරිපත් කර ඇත්තේ අවසාන දිනය ඉක්මවා දින 11 ක් ගතවීමෙන් පසු බව.

ඉල්ලුම්කරු විසින් අයදුම්පත සමග සුදුසුකම් සපුරා ඇති බවට සහතිකයන් ඉදිරිපත් කර නොතිබූ බවත්, ඉල්ලුම්කරුට එකී සුදුසුකම් පවතින්නේ නම් අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් බවත්, ඉල්ලුම්කරු කිසිදු අවස්ථාවක සුදුසුකම් ඉදිරිපත් කර නොමැති බවත්, ඒ අනුව ඉල්ලුම්කරු අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබූ බැවින් අදාළ ලිඛිත විභාගය සඳහා අවස්ථාවක් ලබා දිය නොහැකි බවට ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වූ බව.

මෙම නඩු නිමිත්තට පාදක වී ඇති තනතුර සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් ලිඛිත පරීක්ෂණයක් පවත්වා ඇති බවත්, අයදුම්කරුවන් දෙදෙනාම ලිඛිත පරීක්ෂණය සමත් වී ඇති බවත්, පැවති එක් පුරප්පාඩුව සඳහා ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරු පත් කළ බව.

ඉල්ලුම්කරු මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිදුකරන ලද පැමිණිල්ල අනුව අදාළ තනතුර ලබාදීමේ හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිර්දේශයක් ඉදිරිපත් කර තිබූ බවත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 17/2005 මගින් ලබා දී ඇති උපදෙස් පරිදි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ බවත්, ඉල්ලුම්කරු අදාළ අධ්‍යාපනික සුදුසුකම් සම්පූර්ණ නොකිරීම හේතුවෙන් නීතිමය රෙගුලාසි අනුව අදාළ තනතුර ඉල්ලුම්කරු වෙත ලබාදිය නොහැකි බව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇති බව.

ඉල්ලුම්කරුගේ නිත්‍ය තනතුරට අදාළ සියලු ශ්‍රේණි උසස්වීම් ලබාදීමට වගඋත්තරකාර දෙවන පාර්ශ්වය කටයුතු කර ඇති බව.

ඉල්ලුම්කරු විසින් වගඋත්තරකාර ආයතන වෙත ලබා දී ඇති අධ්‍යාපන සහ තාක්ෂණික සහතික ව්‍යාජ සහතික බව.

ඉල්ලුම්කරු වෙත හිමිවිය යුතු සියලු වැටුප් වර්ධක හා පාරිතෝෂික දීමනා ගෙවීමට ආයතන විසින් සියලු පියවරයන් ගත් නමුත්, ඉල්ලුම්කරු විසින් අදාළ ගෙවීම් ලබාගැනීම ප්‍රතික්ෂේප කර ඇති බවත් ප්‍රමාදය සඳහා ඉල්ලුම්කරු වගකිව යුතු බව.

**තීන්දුව**

මෙකී බේරුම්කරණයේ දී මා විසින් පහත කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමි.

වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් මූලික සාක්ෂි සහ ලිඛිත දේශනය මගින් පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ අධ්‍යාපන සහතික ව්‍යාජ ඒවා බවට කරුණු ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව වගඋත්තරකාර ආයතනය හරස් ප්‍රශ්න විමසීමේ දී ප්‍රශ්න නගා ඇති අතර ඒ සම්බන්ධ 2023.05.12 දින සාක්ෂි සටහන්වල 7 පිටුවෙහි ඉල්ලුම්කරුගේ සාක්ෂිය කෙරෙහි අවධානය යොමු කරමි.

''මාර්ග සංවර්ධන අධිකාරියට මෙම සහතික ඉදිරිපත් කරන්න අවශ්‍ය වුනේ නැහැ. මහාමාර්ග දෙපාර්තමේන්තුවට මෙම සහතික ඉදිරිපත් කරලා තිබුණ නිසා. ව්‍යාජ සහතික කියලා මට චෝදනාවක් ඉදිරිපත් කරලා වැඩ තහනමකට ලක් කළා. ඊට පසුව කම්කරු විනිශ්චය සභාවෙන් එම නඩුව මගේ සහතික පත්‍රවල ප්‍රශ්නයක් නොමැති නිසා සමථයකට පත්වුණා.''

මා විසින් කම්කරු විනිශ්චය සභාව ඉදිරියේ විභාග කර ලද නඩුවට මූලික වූ චෝදනා පත්‍රය සහ එහි තීන්දුව පරීක්ෂා කර බලා එකී තීන්දුව මගින් වගඋත්තරකාර පාර්ශ්වය සමථ යෝජනාවක් මගින් ඉල්ලුම්කාර පාර්ශ්ව නැවත සේවයේ පිහිටුවීමට එකඟ වී නඩුව සමථයකට පත්කර ගෙන ඇති බව නිරීක්ෂණය කළ අතර ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාවේ සමථ නියෝගය අනුව නැවත තීරණයක් ලබාදීමට බේරුම්කරණ අධිකරණයට බලයක් නොමැති බැවින් එකී චෝදනාව ප්‍රතික්ෂේප කරමින් නියෝගයක් ලබා දී ඇත. (2023.05.12 දින සාක්ෂි සටහන් 7 පිටුව)

එබැවින් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුගේ අධ්‍යාපන සහ තාක්ෂණික සුදුසුකම් සහතික පිළිබඳව දක්වා ඇති චෝදනා පිළිබඳවද මීට පෙර කම්කරු විනිශ්චය සභා අංක 01/අති/122/97 දරන නඩුවේ දී සමථයකට එළඹ ඇති බැවින් එකී චෝදනාව විනිශ්චිත කරුණක් යන නෛතික සිද්ධාන්තය *Res Judicata* වන බැවින් එකී චෝදනාව ප්‍රතික්ෂේප කරමි.

පැමිණිලිකාර පළමු පාර්ශ්වය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිදුකරන ලද HRC/7047/06 පැමිණිල්ල සම්බන්ධයෙන් A6 ලෙස ලකුණු කර ඇති පරීක්ෂණ නිලධාරී වාර්තාවේ නිර්දේශය කෙරෙහි අවධානය යොමු කරමි.

"... පැමිණිලිකරුට ප්‍රවාහන නිලධාරී තනතුරේ රැඳී සිටීම මත ඔහුගේ කුසලතා හා ජ්‍යෙෂ්ඨත්වය සැළකිල්ලට ගෙන එම තනතුර ලබාදීමෙන් ගැටලුවක් පැනනොනගී. එසේම ඔහු විසින් කම්කරු විනිශ්වය සභාවට ඉදිරිපත් කළ පැමිණිල්ලේ සමථය මත සේවය නතර කළ දින සිට නැවත සේවයේ පිහිටවූ දින දක්වා කාලය ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වය සඳහා ගණනය කිරීමට ද එකඟව ඇති නිසා එම කරුණු සැලකිල්ලට ගෙන මොහුට අදාළ තනතුර ලබාදීම සුදුසු යැයි නිගමනය කරමි."

එකී වාර්තාව පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් A7 ලෙස ලකුණු කර ඇති ලේඛනය මගින් කොමිෂන් සභාවේ තීරණය දැනුම් දී ඇත. එකී තීරණය මගින් දක්වා ඇත්තේ පරීක්ෂණ නිලධාරී වාර්තාවේ සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු බවයි.

මේ පිළිබඳව අවධානය යොමු කරමින් වගඋත්තරකාර මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත A8 ලෙස ලකුණු කර ඇති 1218/2009 අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. එකී පත්‍රිකාව මගින් මෙහි පැමිණිලිකාර ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතා යාන්ත්‍රික ඉංජිනේරු තනතුර සඳහා උසස්වීමක් ලබා දීම සඳහා අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලීමක් සිදුකර ඇත.

"Considering the above circumstances it is suggested to: Promote Mr. W. A. D. B. Samaraweera, Mechanical Superintendent to the post of Mechanical Engineer (NPQ)..."

එකී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා A9 ලකුණු කර ඇති අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

තවද, A17a ලෙස ලකුණු කර ඇති පාද සටහන පිළිබඳව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් මානව සම්පත් පරිපාලක වරාපිටියහේවාගේ කාන්ති මිය සාක්ෂිය පිළිබඳව අවධානය යොමු කරමි.

" ප්‍ර: අධ්‍යක්ෂක නීති මොකක්ද කියන්නේ?
පි: කියවා සිටී.
ප්‍ර: ඒකේ කෙටි අදහස මොකක්ද කියලා කියන්න?
පි: බෝඩ් ඩිසිෂන් එක අනුව සාධාරණීකරණය කරනවා එඩියුකේෂනල් ඇන්ඩ් ප්‍රොෆෙෂනල් කොලිෆිකේෂන් මත සමරවීර මහතා සහ කුමාරදාස මහතා. ඒකෙන් සමරවීර මහතාට ලබා නොදීම සම්බන්ධයෙන් සහ කුමාරදාස මහතාට ලබාදීපු බව සඳහන් කරනවා. ඒ එක්කම සමරවීර මහතා 2018.11.05 දින විශ්‍රාම යන බවත් සමරවීර මහත්මයා මෙම තනතුර සඳහා පත්කළ හැකි බවට නිර්දේශ කරලා තියෙනවා." - 2023.11.08 දින සාක්ෂි සටහන් හි පිටුව 27.

වගඋත්තරකාර මාර්ග සංවර්ධන අධිකාරියේ උත්තරීතර බලාධිකාරිය වනුයේ සභාපතිවරයා ප්‍රමුඛ අධ්‍යක්ෂක මණ්ඩලයයි. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂක ජනරාල්වරයා ප්‍රමුඛ නිලධාරීන් නෛතිකව බැඳී සිටියි. එසේ වුවත් වගඋත්තරකාර ආයතනයේ නිලධාරීන් එකී අධ්‍යක්ෂක මණ්ඩල තීරණය ක්‍රියාත්මක කර නැත.

දෙපාර්ශ්වය විසින් ම ඉදිරිපත් කරන ලද සියලු සාක්ෂි විමසා බලා පහත තීරණයට එළඹෙමි.

වගඋත්තරකාර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙහි පැමිණිලිකාර පළමු පාර්ශ්වය වන ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට යාන්ත්‍රික ඉංජිනේරු තනතුර ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බවට තීන්දු කරමි.

ඒ අනුව පැමිණිල්ල මගින් ඉල්ලා සිටින,

(අ) පැමිණිලිකාර ඩබ්. ඒ. ඩී. බී. සමරවීර මහතාට පෞද්ගලික වන සේ 2007.02.14 වන දින සිට බලපැවැත්වෙන පරිදි යාන්ත්‍රික ඉංජිනේරු තනතුරට පත්කරන ලෙස ද,

(ආ) 2007 පෙබරවාරි මස 14 වන දින සිට 2018 නොවැම්බර් විශ්‍රාම ලැබූ දිනය දක්වා යාන්ත්‍රික ඉංජිනේරු තනතුරට හිමි මාසික වැටුප් තලය හා වැටුප් වර්ධක අනුව ගණනය කළ විට ගෙවිය යුතු හිඟ මුළු වැටුප, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2024.08.05 දිනැතිව මෙම පරීක්ෂණයට ගොනු කරන ලද RDA/LD/IT/1925 ලේඛනයේ දක්වා ඇති පරිදි රු. 2,107,765.20 ක් ගෙවන ලෙස ද,

(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු තනතුරට හිමි මාසික වැටුප් තලයට අදාළ සේවක අර්ථසාධක අරමුදල්, පාරිතෝෂිත මුදල් ඇතුළු සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවන ලෙස ද,

පළමු පාර්ශ්වය වෙනුවෙන් මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ වී දින 30 ක් ඇතුළත එකී මුදල් නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලය වෙත ගෙවන මෙන් දෙවන පාර්ශ්වයේ වගඋත්තරකාර ආයතනය වන මාර්ග සංවර්ධන අධිකාරියට මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ
බේරුම්කරු.

2024 අගෝස්තු මස 24 වැනි දින.

EOG 09 – 0203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.